2011 ජූනි
වෙළුම 8 කාණ්ඩය 1

# තේ තතු

ISSN-1391-6785 ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි.

## ගෙවත්තට කොම්පොස්ට් හා පණු දියර පොහොර සාදා ගනිමු

කාබනික ගොවිතැන ගැන වර්තමාන සමාජයේ අන් කවරදාකටත් වඩා පුළුල් කතිකාවක් ගොඩ නැගී පවතී. ඇතැම් ක්ෂේත්‍ර භෝග සඳහා රසායනික පොහොරවලට එක්තරා ප්‍රමාණයක ආදේශකයක් ලෙසද කාබනික පොහොර භාවිතය ගැනේ. කෙසේ වෙනත් වර්ධක කොටස් අස්වැන්න ලෙස භාවිතා කරන තේ වැනි බහුවාර්ෂික භෝගයකට එවැනි ක්‍රමයන් භාවිතා කිරීමේ බරපතල සීමාකම් පවතිනමුත්, අප යොදන අකාබනික පොහොර වල අවශෝෂණයේ කාර්‍යක්ෂමතාව වැඩි දියුණු කිරීමෙහි ලා කාබනික පොහොරවලට සුවිශාල කාර්‍යභාරයක් ඇත. කාබනික පොහොර සපයාගත හැකි ප්‍රභවයන් දෙකක් වන කොම්පොස්ට් හා පණු දියර පිළිබඳ ලියා ඇති මෙම ලිපිය කියවා බලන්න.



ශාක කොටස් හා සත්ව අපද්‍රව්‍ය කොටස් පාංශු ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය නිසා භෞතිකව හා රසායනිකව සිදුවන ජීර්ණ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස නිපදවෙන ස්වාභාවික පොහොරක් ලෙස කොම්පෝස්ට් හැඳින්විය හැක.

මෙම ක්‍රියාවලිය නිසි ලෙස සිදුවීම සඳහා නියමිත උෂ්ණත්වය, තෙතමනය හා වාතාශ්‍රය අවශ්‍ය වේ. කොම්පෝස්ට් සාදා ගැනීමේ ක්‍රම කිහිපයක් ඇති අතර ඒ අතරින් වඩාත් ප්‍රායෝගික ක්‍රමයක් වන ගොඩ ක්‍රමය මෙහිදී විස්තර කෙරේ.

මේ සඳහා ජලයෙන් යට නොවන හොඳින් ජලවහනය වන තැනිතලා බිමක් සුදුසුය. කොම්පෝස්ට් ගොඩේ පලල අඩි 4 ක් පමණද දිග පහසු ප්‍රමාණයක් වන ලෙසද ගෙන කොම්පෝස්ට් නිපදවන ස්ථානය සලකුණු කර ගන්න.

❒ එම සලකුණු කර ගත් ප්‍රදේශය තුල පස මදක් බුරුල් කර අඟල් 3-4 ක් පමණ කලින් සැකසූ කොම්පෝස්ට් (මුහුම්) තට්ටුවක් අතුරන්න. ඉන් පසු වියලි කොල හෝ තණකොළ, මාන හෝ කොල අතු අඟල් 10-12 පමණ තට්ටුවක් ලෙස අතුරන්න. අමු ගොම දියකර ද්‍රාවණයක් ලෙස මෙම තට්ටුව මත යොදන්න.



❒ මීලඟ තට්ටුව ලෙස සත්ව පොහොර හෝ දිරාපත් වීමට පහසු ශාක කොටස් තැන්පත් කරන්න. මෙම තට්ටුවද අඟල් 10-12 ක් පමණ උසට යෙදීම ප්‍රමාණවත්ය. කෙසේ වුවත් සත්ව පොහොර දෙවන තට්ටුවට භාවිතා කරන්නේ නම් තට්ටුවේ උසට තරමක් වැඩිවුවද කම් නැත.

❒ දෙවන තට්ටුවට සත්ව පොහොර භාවිතා කළ හොත් තුන් වන තට්ටුව ලෙස ශාක කොටස්, වියලි ගිය කොළරොඩු, පිදුරු මානා ආදිය භාවිතා කළ හැක. මෙයද පෙර පරිදි අඟල් 10 -12 තට්ටුවක් ලෙස යෙදිය හැක.

තුන්වන තට්ටුවෙන් පසු ගොඩ අඩි 4-41/2 පමණ උස් වන පරිදි සත්ව හා ශාක කොටස් මාරුවෙන් මාරුවට තට්ටු ලෙස තැම්පත් කරන්න. එප්පාවල රොක්පොස්පේට් තිබේනම් ඉන් ස්වල්පය බැගින් තට්ටු සෑදීමේදී ඉසීම ප්‍රතිඵලදායක වේ. එසේම අමු ගොම දිය කර ඉසීමද ක්ෂුද්‍ර ජීවි ක්‍රියාකාරීත්වය ඉක්මන් කරයි.

දිරාපත් වීමට අපහසු අමුද්‍රව්‍ය ( පිදුරු, මානා, වියලී ගිය කොලරොඩු, කසළ තේ ආදී ) හා දිරාපත් වීමට පහසු අමුද්‍රව්‍ය ( වල් සූරියකාන්ත, ග්ලිරිසීඩියා, අමුගොම වැනි දෑ ) ගොඩේ මාරුවෙන් මාරුවට තැම්පත් කිරීම වඩා යෝග්‍ය වේ. ක්ෂුද්‍ර ජීවි ක්‍රියාකාරීත්වය සඳහා ගොඩ තුලට අවශ්‍ය වාතාශ්‍රය ලැබීම වැදගත්වේ. මෙයින් ගොඩ දිරාපත්වීම ඉක්මන් වේ. ඒ සඳහා ගොඩ සෑදීමේදී හරස් අතට හා උස් අතට උණ බම්බු හෝ ලී යොදා දින තුන හතරකට පසු ඉවත් කිරීමෙන් අවශ්‍ය වාතය ගොඩ තුළට ලබා දිය හැකි වේ. එසේ නොවුන හොත් නිර්වායු බැක්ටීරියාවන් ගේ ක්‍රියාකාරීත්වය හේතුවෙන් බලාපොරොත්තු වන අරමුණ ඉෂ්ඨ කර ගත නොහැකි වේ.

ගොඩ තුළ තෙතමනය නිසි පරිදි පවත්වා ගැනීම වැදගත් වේ. කෝටුවක් ගොඩ තුළට යවා වරින් වර තෙතමනය පරීක්ෂා කර අවශ්‍ය වේ නම් ජලය යොදා ගත හැක. ගොඩ සාදා ගත් පසු ඊට වාතය ඇතුළු වීමට බාධා නොවනසේ කළු පොලිතීන් ආවරණයක් පොළව මට්ටමේ සිට අඟල් 6 1/2 පමණ උඩින් සිටින සේ ආවරණය කිරීම සුදුසුයි.

සති 3-4 ක් ඉකුත් වූ පසු පළමු පෙරළීම කරන්න. හොඳින් මිශ්‍ර වන සේ පෙරළීම සිදු කර නැවත ගොඩ සකසන්න. පලමු පෙරළීමෙන් සති 3-4 කට පසු දෙවන පෙරළීමද ඉන් සති 3-4 කට පසු තෙවන පෙරළීමද සිදු කරන්න. අමුද්‍රව්‍ය හොඳින් දිරාපත් වී තෙවන පෙරළීම සිදු කරන විට කොම්පෝස්ට් බවට පරිවර්තනය වී ඇති අතර ඉන් අනතුරුව එම කොම්පෝස්ට් ඔබගේ ක්ෂේත්‍රයට යොදා ගත හැක.

### පණු දියර පොහොර

තේ බෝග වගාවේදී පත්‍ර මතට යොදන දියර පොහොර ද භාවිතා කරයි. රසායනික දියර පොහොර වර්ග අපට වෙළඳ පොළෙන් මිලදී ගත හැක. කාබනික දියර පොහොර සාදා ගන්නා අන්දම මෙම ලිපිය මඟින් විස්තර කෙරේ. මේ සඳහා එක් පැත්තක් විවෘත බැරලයක් ගෙන (ප්ලාස්ටික් එකක් වඩා සුදුසු වේ) බැරලයේ පැත්තකින් පතුලට අඟලක් පමණ ඉහළින් සිදුරක් සාදා කරාමයක් සවිකරගන්න කරාමය අවශ්‍ය වනුයේ දියර පොහොර එකතු කර ගැනීමටයි. බැරලය අඩි 01 පමණ උස ආධාරකයක් මත සිටින සේ තබන්න. මුලින්ම අඟලක් පමණ ප්‍රමාණයට කපා ගත් ගඩොල් කැබලි අඟල් 8-10 පමණ උස තට්ටුවක් ලෙස බැරලය තුළ අතුරන්න. එයට උසින් අඟල් 8-10 පමණ වන පරිදි වැලි තට්ටුවක් අසුරන්න. ගඩොල් සහ වැලි යොදන්නේ ද්‍රව්‍ය පෙරීමටය. වැලි තට්ටුව මත අඩි 1-11/2 පමණ උසට සරු ලොම් පස් තට්ටුවක් යොදන්න. මෙය හොඳින් තෙත් කර ක්ෂේත්‍රයෙන් ලබා ගත් ගැඩවිලි පණුවන් 50 පමණ ඇතුළු කරන්න. මෙය මතට අමු හෝ වියලි ගොම තට්ටුවක්ද එය මතට පිදුරු හෝ වියලි කොලරොඩු තට්ටුවක් යොදන්න. මෙයට ජලය ස්වල්පයක් එක් කර කරාමය විවෘත කර අමතර ජලය ඉවත් වූ පසු වසා තබන්න. ඉන්පසු දිනපතා සෙමින් ජලය එක් කර තෙතමනය පවත්වා ගන්න. එම කාලය තුළ කරාමය විවෘත කර වැඩිපුර ජලය ඉවත් කරන්න. මෙය සති 2 ක් පමණ කාලයක් දිනපතා කිරීමෙන් ගැඩවිලන්ගේ වර්ධනය මෙන්ම සංඛ්‍යාවද වැඩි වේ. සති 2 ට පමණ පසු කරාමය වසා ඇටවුමට ඉහලින් ලීටර් 5-6 ධාරිතාවක් ඇති පතුලේ කුඩා සිදුරු 2-3 ක් සාදා රෙදි තිර රැඳවූ බඳුනක් එල්ලා ජලය ලීටර් 5 ක් පමණ පුරවා ජල බිංදු වැස්සීමට සලස්වන්න. ඊට පසු දින කරාමය හැර දියර පොහොර ලබා ගත හැක. නැවතත් කරාමය වසා භාජනයට වතුර පුරවා දියර පොහොර එකතු කර ගත හැක. මෙය දිනපතා කිරීමෙන් දියර පොහොර සදා ගත හැක. එකතු කළ ගොම හා පිදුරු අවසන් වීමට පෙර නැවත එකතු කරන්න. අවු 1 ට පමණ පසු සියළුම ද්‍රව්‍ය ඉවත් කර නැවත අළුතින් ද්‍රව්‍ය එකතු කරන්න. දියර පොහොර ඉසීමට පෙර ජලය යොදා තුන් ගුණයක් පමණ තනුක කර ගන්න.

සමන් විජේතුංග